# සංවලිතත්වයෙහි පෙලඹවීම, බෞද්ධ දාර්ශනික එළඹුමක්

**පනාමුරේ චන්දිම හිමි**[1]

පෙලඹවීම, මෙහෙයවීම නැතහොත් අභිප්‍රේරණය යන වදන් නූතන මනෝවිද්‍යාවේ අතිශයින් ජනප්‍රිය සංකල්පයෝ වෙති. පෙලඹවීම වනාහි මනුෂ්‍ය චිත්තාභ්‍යන්තරයෙහි ඇතිවන්නකි. එම ආභ්‍යන්තරික මෙහෙයවීම අනුව සත්වයා ක්‍රියාත්මක වෙයි. තවද සත්ත්වයන් නිශ්චිත ස්තරයන් තුළ ජීවත් වන්නේ ද එම ආභ්‍යන්තරික බලපෑම හේතුවෙනි. මෙය වනාහි බාහිරව දැකිය හැකි දෙයක් නොවන අතර එය චර්යාව මගින් පිළිබිඹු වන්නකි. මිනිස් චර්යාවේ මූල සාධක විවරණය කළ හැක්කේ මෙම පෙළඹවීම මුල්කර ගෙනය. චේතනාවන් මිනිස් සිතෙහි හටගන්නේ පෙලඹවීම මත ය. නූතන මනෝවිද්‍යාඥයන්ගේ අදහස වන්නේ චේතනාවන් හා පෙලඹවීම යනු එකක් බවයි. එහෙත් බුදු දහමට අනුව චේතනාව හා පෙලඹවීම යනු අන්‍යෝන්‍ය සබඳතාවක් ඇති කරුණු දෙකක් බව පැහැදිලි ය.

නූතන මනෝවිද්‍යාඥයන් පෙන්වා දෙන ආකාරයට පෙලඹවීමේ විවිධ ප්‍රභේද තිබේ. ඒ අතර ප්‍රධාන බෙදීමක් මෙසේ හඳුනාගත හැකිය

01. ප්‍රාථමික පෙලඹවීම
02. සාමාන්‍ය පෙලඹවීම
03. සමාජමූල පෙලඹවීම  වශයෙනි.

ප්‍රාථමික පෙලඹවීම මූලික වශයෙන් දේහවිද්‍යාත්මක පදනමක පිහිටා විග්‍රහ කර තිබේ. ඒවා ශරීර අභ්‍යන්තරයේ සමතුලිත බව ආරක්ෂාකර ගැනීමට යෙදා ගන්නා පෙලඹවීම් වේ. වාස්තවික භාවයෙන් යුක්ත පෙලඹවීම් සාමාන්‍ය පෙලඹවීම් වශයෙන්ද සහජයෙන් නොගෙනෙන පෙලඹවීම් සමාජමූල පෙලඹවීම් වශයෙන්ද සැලකේ. මෙම නූතන මනෝවිද්‍යාත්මක ඉගැන්වීම් බුදු දහමේ ඉගැන්වීම් තරම් සියුම් නොවන අයුරු අවබෝධ කර ගතහැකිය.

බුදු දහමෙහි දක්වා ඇති පෙලඹවීමේ ක්‍රමෝපායන් කායික පෙලඹවීම් හා මානසික පෙලඹවීම් වශයෙන් දෙයාකර කොට

---

[1] පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
Email: chandimpanamure@gmal.com

දැක්විය හැකිය. සෙසු ඉගැන්වීම් අතර බෞද්ධ දර්ශනයේ එන මෙම ඉගැන්වීම සුවිශේෂ වන්නේ එබැවිනි.

සූත්‍ර පිටකයට අයත් විවිධ සූත්‍ර තුළ විවිධාකාරයේ පෙලඹවීම් න්‍යායන් දැකිය හැකිය. ඒ අතර අංගුත්තර නිකායේ පචලායන සූත්‍රයේ එන කරුණු කෙරෙහි මෙහි දී අවධානය යොමු කෙරේ. එය වනාහි බුදුරජාණන් වහන්සේ විසින් මුගලන් මහ රහතන් වහන්සේට දේශනා කර තිබේ. එහි එන පෙලඹවීමට අදාළ කරුණු හතක් ඇතුළත් කොට බෞද්ධ දර්ශනයේ එන පෙලඹවීම් න්‍යායක් ගොඩ නැගීම මෙහි අපේක්ෂාව වේ.

ප්‍රමුඛ පද: සඵලත්වය පෙළඹීවීම අංගුත්තර නිකාය

**Title:** A Buddhist Approach to Motivation of Productivity (with Reference to *Pachalayana Sutta* in the Anguttaranikaya

**Keywords:** Motivation, Productivity, Anguttara Nikaya